## තුන්වැනි කොටස

# මුදල් මණ්ඩලය විසින් 1983 දී උපයෝගී කරගනු ලැබූ ප්‍රධාන පරිපාලන විධිවිධාන


| | | | | පිටුව |
|---|---|---|---|---|
| 1. | ශ්‍රී ලංකා මහ බැංකුවේ 1985, 6% භාරක බැඳුම්කර | — චක්‍රලේඛ අංක | 936 | I |
| 2. | අත්තිකාරම් සඳහා ශ්‍රී ලංකා මහ බැංකු පොළී අනුපාතික | — චක්‍රලේඛ අංක | 945 | II |
| 3. | අත්තිකාරම් සඳහා ශ්‍රී ලංකා මහ බැංකු පොළී අනුපාතික | — චක්‍රලේඛ අංක | 947 | III |
| 4. | අපනයන ණය ප්‍රතිමූල්‍යනය | — චක්‍රලේඛ අංක | 969 | III |
| 5. | 1983 අංක 1 දරන හදිසි අවස්ථා (විනාශ වූ දේපළ, ව්‍යාපාර හෝ කර්මාන්ත පුනරුත්ථාපනය කිරීමේ) නියෝග | — චක්‍රලේඛ අංක | 998 | IV |
| 6. | වෙළෙඳ බැංකු ණය | — චක්‍රලේඛ අංක | 1029 | VI |
| 7. | වෙළෙඳ බැංකුවලට මහ බැංකුවෙන් දෙනු ලබන අත්තිකාරම් | — චක්‍රලේඛ අංක | 1033 | VII |
| 8. | වෙළෙඳ බැංකු ණය | — චක්‍රලේඛ අංක | 1042 | VII |

චක්‍ර ලේඛ අංක. 936

බැංකු කටයුතු දෙපාර්තමේන්තුව,
ශ්‍රී ලංකා මහ බැංකුව,
තැ. පෙ. 590,
කොළඹ 1.
1983 පෙබරවාරි 25.

## ශ්‍රී ලංකා මහ බැංකුවේ 1985, 6% හාරක බැඳුම්කර

1. වර්ෂ 1980 දෙසැම්බර් 19 වැනි දින අංක 536 දරණ චක්‍රලේඛය වෙත අවධානය යොමු කරනු ලැබේ. එහි සඳහන් පරිදි 1980 මැයි 27 වැනි දිනැති අංක 482 දරණ ශ්‍රී ලංකා මහ බැංකුවේ චක්‍රලේඛය ප්‍රකාර නිකුත් කරනු ලැබූ හාරක බැඳුම්කර, 1983 මාර්තු 1 වැනි දින හෝ ඊට පසු හාරකයාගේ කැමැත්ත පරිදි නිදහස් කර ගත හැකිය. පහසුවෙන් බලා ගැනීම සඳහා අංක 536 දරණ චක්‍රලේඛයේ පිටපතක් මේ සමග එවා ඇත.

2. ඒ අනුව මහ බැංකුව විසින් නිකුත් කර ඇත්තාවූද, මුදල් ලබා ගැනීම සඳහා 1983 මාර්තු 1 වැනි දිනට පසුව ඉදිරිපත් කරනු ලබන්නාවූ ද, 1985, 6% හාරක බැඳුම්කර මුහුණත අගය මත මහ බැංකුව විසින් ගෙවා නිදහස් කරනු ලැබේ. කොළඹ පිහිටි ශ්‍රී ලංකා මහ බැංකුවේ බැංකු කටයුතු දෙපාර්තමේන්තුවට හෝ ඕනෑම වාණිජ බැංකුවක ප්‍රධාන කාර්යාලයට හෝ මූලස්ථානයට හෝ ඕනෑම වාණිජ බැංකු ශාඛාවකට හෝ එවැනි බැඳුම්කර මුදල් කරගැනීම සඳහා ඉදිරිපත් කළ හැකිය.

3. 1985 මාර්තු 1 වැනි දිනට ප්‍රථම මුදල් කරගැනීම සඳහා ඉදිරිපත් කරනු ලබන බැඳුම්කර එසේ ඉදිරිපත් කරන අවස්ථාවේදී සම්පූර්ණ නොවූ යම් අර්ධ වාර්ෂිකයකට අදාළව ගෙවිය යුතු පොළිය සඳහන් කරන කූපන්පත් සමග ඉදිරිපත් කළ යුතුය.

4. 1983 මාර්තු 1 වැනි දිනට හෝ ඊට පසුව එහෙත් 1983 සැප්තැම්බර් 1 වැනි දිනට ප්‍රථම ඉදිරිපත් කරනු ලබන බැඳුම්කර සමග අංක 7 සිට 10 දක්වා කූපන්පත් තිබිය යුතුය. අංක 6 දරණ කූපනයට ගෙවනු ලබන පොළිය, බැඳුම්කරයට කූපනය අමුණා තිබුණත් නැතත් ඉදිරිපත් කළ විට සම්පූර්ණයෙන්ම ගෙවනු ලැබේ. අංක 7 දරණ කූපනය සම්බන්ධයෙන් අවුරුද්දකට දවස් 360 ක පදනම යටතේ 1983 මාර්තු 1 වැනි දින සිට ඉදිරිපත් කරන දිනය තෙක් ගණනය කොට පොළිය ගෙවනු ලැබේ. ප්‍රස්තුත බැඳුම්කරය/බැඳුම්කර මුදා හැරීමේ ප්‍රතිඵලයක් වශයෙන් පොළී නොගෙවනු ලබන කූපන්පත් අවලංගු කරනු ලැබේ.

5. 1983 සැප්තැම්බර් 1 වැනි දිනට හෝ ඊට පසුව එහෙත් 1984 මාර්තු 1 වැනි දිනට ප්‍රථම මුදල් සඳහා ඉදිරිපත් කරනු ලබන බැඳුම්කර සමග අංක 8–10 දක්වා කූපන් පත් තිබිය යුතුය. අංක 7 දරණ කූපනයට ගෙවනු ලබන පොළිය බැඳුම්කරයට කූපනය අමුණා තිබුනත් නැතත් ඉදිරිපත් කළවිට සම්පූර්ණයෙන් ගෙවනු ලැබේ. අංක 8 දරණ කූපනය සම්බන්ධයෙන් අවුරුද්දකට දවස් 360 ක පදනම යටතේ 1983 සැප්තැම්බර් 1 වැනි දින සිට ඉදිරිපත් කරන දිනය තෙක් ගණනය කොට පොළිය ගෙවනු ලැබේ. ප්‍රස්තුත බැඳුම්කරය/බැඳුම්කර මුදල් කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් පොළී නොගෙවනු ලබන කූපන්පත් අවලංගු කරනු ලැබේ.

6. 1984 මාර්තු 1 වැනි දිනට හෝ ඊට පසුව එහෙත් 1984 සැප්තැම්බර් 1 වැනි දිනට ප්‍රථම මුදල් සඳහා ඉදිරිපත් කරනු ලබන බැඳුම්කර සමග අංක 9 සහ 10 දරණ කූපන්පත් තිබිය යුතුය. අංක 8 දරණ කූපනයට ගෙවනු ලබන පොළිය, බැඳුම්කරයට කූපනය අමුණා තිබුනත් නැතත් ඉදිරිපත් කළ විට පොළිය සම්පූර්ණයෙන් ගෙවනු ලැබේ. අංක 9 දරණ කූපනය සම්බන්ධයෙන් අවුරුද්දකට දවස් 360 ක පදනම යටතේ 1984 මාර්තු 1 වැනි දින සිට ඉදිරිපත් කරන ලද දිනය තෙක් ගණනය කොට පොළිය ගෙවනු ලැබේ. ප්‍රස්තුත බැඳුම්කරය/බැඳුම්කර මුදල් කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් පොළී නොගෙවනු ලබන කූපන්පත් අවලංගු කරනු ලැබේ.

7. 1984 සැප්තැම්බර් 1 වැනි දිනට හෝ ඊට ප්‍රථමයෙන් එහෙත් 1985 මාර්තු 1 වැනි දිනට ප්‍රථම මුදල් ලබා ගැනීම සඳහා ඉදිරිපත් කරනු ලබන බැඳුම්කර සමග අංක 10 දරණ කූපන්පත් තිබිය යුතුය. අංක 9 දරණ කූපනයට ගෙවනු ලබන පොලිය, බැඳුම්කරයට කූපනය අමුණා තිබුණත් නැතත් සම්පූර්ණයෙන් ගෙවනු ලැබේ. අංක 10 දරණ කූපනය සම්බන්ධයෙන් අවුරුද්දකට දවස් 360 ක පදනම යටතේ 1984 සැප්තැම්බර් 1 වැනි දින සිට මුදල් සඳහා ඉදිරිපත් කරන ලද දිනය දක්වා ගණනය කොට පොලිය ගෙවනු ලැබේ.

8. මහ බැංකුව විසින් නිකුත් කරන ලද 1985, 6% යම් භාරක බැඳුම්කර යථෝක්ත අංක 2 සිට 7 දක්වා වූ ඡේදයනට අනුකූලව ඉදිරිපත් කරනු ලැබුවහොත් ඒවා මුදල් කිරීම සඳහා බාරගන්නා ලෙසත්, එකී බැඳුම්කර ඉදිරිපත් කරන පුද්ගලයින්ට බැඳුම්කරවල මුහුණත වටිනා කම හා යථෝක්ත අංක 4 සිට 7 දක්වා වූ ඡේදයන්හි නියමිත පොලිය ගෙවන ලෙසටත් වෙළෙඳ බැංකු වලින් ඉල්ලා සිටිනු ලැබේ. තවද මේ සම්බන්ධයෙන් කිසිදු පිටසන් කිරීමක් බේරුම් කිරීමක් හෝ අත්සන් කිරීමක් හෝ එවැනි පුද්ගලයෙකුගේ අනන්‍යතාවය පිළිබඳ විමසීමක් හෝ නොකළ යුතුය.

9. මුදල් කරන ලද බැඳුම්කර කූපන්පත් සමග ප්‍රතිමූල්‍යනය කිරීම සඳහා කොළඹ, ශ්‍රී ලංකා මහ බැංකුවේ, ප්‍රධාන ගණකාධිකාරී වෙත ඉදිරිපත් කළ යුතුය. මුදල් ගෙවන ලද බැඳුම්කරවල '' ගෙවන ලදී '' යන්නත්, කූපන්පත්වල '' රු. ............ ගෙවන ලදී '' යන්නත් සඳහන් කළ යුතුය. අදළ වෙළෙඳ බැංකුවල ශ්‍රී ලංකාවේ ප්‍රධාන කාර්යාලය හෝ මූලස්ථානය විසින් බැඳුම්කර හා කූපන්පත් ප්‍රධාන ගණකාධිකාරීට එවිය යුතුය.

ඒ. ටී. ඩබ්ලිව්. ජෙහෝරත්නම්
ප්‍රධාන ගණකාධිකාරී.

වර්ණසේන රාසපුත්‍රම්
අධිපති.

වක්‍රලේඛ අංක. 945

සම්බන්ධ අංකය : බීසී/6–III වෙළුම

සියළුම වෙළෙඳ බැංකු වෙත,

බැංකු කටයුතු දෙපාර්තමේන්තුව,
ශ්‍රී ලංකා මහ බැංකුව,
තැ. පෙ. 590,
කොළඹ.
1983 මාර්තු 23

## අත්තිකාරම් සඳහා ශ්‍රී ලංකා මහ බැංකු පොලී අනුපාතික

වර්ෂ 1983 මාර්තු 24 වැනි බ්‍රහස්පතින්දා සිට ප්‍රතිශෝධිත බැංකු පොලී සහ වට්ටම් අනුපාතික මහ බැංකුව විසින් අය කරනු ලැබේ. රජයේ හා රජය විසින් සහතික කරන ලද සුරැකුම් පත් හා භාවිතීය පොරොන්දු නෝට්ටු ඇප වශයෙන් තබාගෙන මහ බැංකුව විසින් වෙළෙඳ බැංකු වලට වාණිජ හා නිෂ්පාදන ණය වෙනුවෙන් දෙනු ලබන අත්තිකාරම් සඳහා පොලී අනුපාතිකය වර්ෂයකට සියයට 13 ක් වනු ඇත.

2. ශ්‍රී ලංකාවේ අපනයන මූල්‍යකරණය සඳහා වෙළෙඳ බැංකු වලට සහාය වීම පිණිස මහ බැංකුවෙන් වෙළෙඳ බැංකුවලට දෙනු ලබන ප්‍රතිමූල්‍ය ණය පහසුකම් සඳහා පොලී අනුපාතිකය වර්ෂයකට සියයට 11 ක් වනු ඇත.

3. මහ බැංකුව විසින් මධ්‍ය හා දිගුකාලීන ණය ක්‍රමය යටතේ දෙනු ලබන ප්‍රතිමූල්‍ය ණය සඳහා අයකරන පොලී අනුපාතිකය 1983 මාර්තු 24 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි වර්ෂයකට සියයට 1 කින් අඩු කරනු ලැබේ.

4. එසේ වුවද, අනුමත කරන ලද වගාවන් සහ භාණ්ඩ මිළදී ගැනීම සහ ගබඩා කිරීම සඳහා සහතික මිළ ක්‍රමය යටතේ හා පදනම් මිළ ක්‍රමය යටතේ දෙනු ලැබූ ප්‍රතිමූල්‍ය ණය සඳහා වන මහ බැංකු පොලී අනුපාතිකය පිළිවෙලින් වර්ෂයකට සියයට 1 සහ සියයට 3 වශයෙන් නොවෙනස්ව පවතිනවා ඇත.

5. අංක බීඩී/6/83 හා 1983 මාර්තු 16 දිනැති මෙහෙයවුම් උපදෙස් අනුව මහ බැංකුව වෙත ඉදිරිපත් කරනු ලබන පොරොන්දු නෝට්ටුපත් වට්ටම් කිරීමේ අනුපාතිකය 1983 මාර්තු 24 වැනි බ්‍රහස්පතින්දා සිට වර්ෂයකට සියයට 7 ක් වනු ඇත.

6. 1981 අගෝස්තු 17 දිනැති අංක 636 දරණ චක්‍රලේඛය මෙයින් අවලංගු කරනු ලැබේ.

**ඒ. ටී. ඩබ්ලිව්. ජෙහෝරත්නම්**
ප්‍රධාන ගණකාධිකාරී.

**වර්ණසේන රාසපුත්‍රම්**
අධිපති.

**චක්‍රලේඛ අංක. 947**
**සම්බන්ධ අංකය : බීසී /6-III වෙළුම**

ශ්‍රී ලංකා මහ බැංකුව,
තැ.පෙ. 590,
කොළඹ.
1983 මාර්තු 30

**සියළුම වෙළෙඳ බැංකු වෙත,**

## අත්තිකාරම් සඳහා ශ්‍රී ලංකා මහ බැංකු පොළී අනුපාතික

1981 ජුනි 2 වැනි දින හා අංක 604 දරණ චක්‍රලේඛය සංශෝධනය කිරීම පිණිස නිකුත් කරන ලද 1981 අගෝස්තු 17 වැනි දින හා අංක 637 දරණ චක්‍රලේඛය මෙයින් අවලංගු කරනු ලබන බවත්, එකී 1981 ජුනි 2 වැනි දින හා අංක 604 දරණ චක්‍රලේඛයේ 3 වැනි ඡේදය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කරන බවත් වෙළෙඳ බැංකු වෙත දැනුම් දෙනු ලැබේ.

> "3. තාවකාලික මුදල් හිඟයන් පිරිමසා ගැනීම උදෙසා වෙන් කර ඇති සීමාවන් (ඉහත 1 වැනි ඡේදය බලන්න) ඉක්මවා පහසුකම් සළසන ලෙස වෙළෙඳ බැංකු වෙතින් ලැබෙන ඉල්ලුම්පත් සළකා බැලීමට මහ බැංකුව සූදානම්ය. වර්ෂයකට සියයට 20 පොළී අනුපාතිකයක් යටතේ එවැනි පහසුකම් සළසනු ලැබේ".

මෙම පොළී අනුපාතිකය වහාම ක්‍රියාත්මක වන පරිදි අදාළ වනු ඇත.

**ඒ. ටී. ඩබ්ලිව්. ජෙහෝරත්නම්**
ප්‍රධාන ගණකාධිකාරී.

**වර්ණසේන රාසපුත්‍රම්**
අධිපති.

**චක්‍රලේඛ අංක. 969**

**සම්බන්ධ අංකය : බීසී/6 IV වෙළුම**

ශ්‍රී ලංකා මහ බැංකුව,
බැංකු කටයුතු දෙපාර්තමේන්තුව,
තැ. පෙ. 590,
කොළඹ 1.
1983 ජුනි 1

**සියළුම වෙළෙඳ බැංකු වෙත,**

## අපනයන ණය ප්‍රතිමූල්‍යායනය

අපනයන කරුවන්ට දෙනු ලබන ණය වෙනුවෙන් වෙළෙඳ බැංකුවලට මුදා හරිනු ලබන මුළු අත්තිකාරම් වල සීමාව 1983 ජුනි 1 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි වැඩි කිරීමට තීරණය කර ඇති බව බැංකු වෙත මෙයින් දැනුම් දෙනු ලැබේ. වෙළෙඳ බැංකුවලට මෙම මුදල් වෙන් කරනු ලබන පදනම වනුයේ, 1982 දෙසැම්බර් 31 වැනි දිනට විවිධ බැංකුවලට අපනයන වෙනුවෙන් දෙනු ලදුව, නොබේරා ඇති අත්තිකාරම් ප්‍රමාණය වන අතර, එක් බැංකුවකට වෙන් කරනු ලබන අවම සීමාව රුපියල් දශ ලක්ෂ 5 කට යටත් වෙයි. එක් එක් බැංකුවකට වෙන් කරනු ලබන ප්‍රමාණය ඒ ඒ බැංකුව වෙත දැනුම් දෙනු ලැබේ.

2. එකී ප්‍රතිමූල්‍යනය ණය වෙනුවෙන් අයකරනු ලබන පොළී අනුපාතිකය 1983 ජුනි 1 වැනි දින සිට වසරකට සියයට 10 ක් වන අතර, එසේ ප්‍රතිමූල්‍යනය කරනු ලබන වෙළෙඳ බැංකුවක් මගින් දෙනු ලබන ණයක් සම්බන්ධයෙන් යම් අනුග්‍රාහකයෙකු වෙනුවෙන් අය කරනු ලබන පොළී අනුපාතිකය වසරකට සියයට 13 කට වැඩි නොවිය යුතුය යන කොන්දේසියට යටත් වෙයි.

3. මෙම පහසුකම යටතේ දෙනු ලබන ප්‍රතිමූල්‍යනය ණය දින 90 කට නොවැඩි කාලපරිච්ඡේදයක් සඳහා මුදහරිනු ලැබේ. කුමන හේතුවක් නිසාවත් කල් දිගු කිරීම් සලකා බලනු නොලැබේ.

4. ප්‍රතිමූල්‍යනය ණය අපේක්ෂිත බැංකුවක් මගින් එසේ ගණුදෙනුකරුවන්ට අත්තිකාරම් වශයෙන් දෙනු ලබන ණය මුදල් නියත වශයෙන්ම ඒවා මුදහරිනු ලැබූ කාරණය සඳහා පමණක් ප්‍රයෝජනයට ගන්නා බවට හා එම බැංකු වෙත ඉදිරිපත් කරනු ලබන අපනයන බිල්පත් අය ලැබීම් වලින් අත්තිකාරම් මුදල බේරුම් කරනු ලබන බවට සෑහීමකට පත්විය යුතුය.

**එච්. ප්‍රේමරත්න**
විධායක අධ්‍යක්ෂ

**වර්ණසේන රාසපුත්‍රම්**
අධිපති.

**චක්‍රලේඛ අංක. 998**

බැංකු කටයුතු දෙපාර්තමේන්තුව,
ශ්‍රී ලංකා මහ බැංකුව,
34 – 36 ජනාධිපති මාවත,
කොළඹ 1.
1983 අගෝස්තු 15

සියළුම වෙළෙඳ බැංකු වෙත,

## 1983 අංක 1 දරන හදිසි අවස්ථා (විනාශ වූ දේපළ, ව්‍යාපාර හෝ කර්මාන්ත පුනරුත්ථාපනය කිරීමේ) නියෝග

(40 වන අධිකාරය වූ) මහජන ආරක්ෂක ආඥාපනතේ 5 වන වගන්තිය යටතේ 1983 අගෝස්තු 6 වැනි දින ජනාධිපතිවරයා විසින් සාදන ලද නියෝග 1983 අගෝස්තු 7 වන ඉරු දින අංක 257/3 දරණ රජයේ අතිවිශේෂ ගැසට් පත්‍රයෙහි සඳහන් විය. බැංකු විසින් මෙම රෙගුලාසි අධ්‍යයනය කොට එහි අන්තර්ගත කරුණුවල බලපෑම් මොනවාදයි වටහා ගැනීමට යෝජනා කර ඇත.

2. නියෝගවල 9 වන ඡේදය කියැවෙන ආකාරයට—

"9. (1) සෑම විනාශ වූ දේපළක්, කර්මාන්තයක් හෝ ව්‍යාපාරයක්ම, මේ නියෝග බලපැවැත්වීම ආරම්භ වන දිනයේ සිට ක්‍රියාත්මක වන පරිදි, සියළු බැඳීම්-වලින් තොරව, රජය වෙත සතු වන්නේය.

(2) යම් දේපළක්, කර්මාන්තයක් හෝ ව්‍යාපාරයක්, විනාශ වූ දේපළක් කර්මාන්ත-යක් හෝ ව්‍යාපාරයක්ද යන්න සම්බන්ධයෙන් යම් ප්‍රශ්නයක් පැන නැගුන අවස්ථාවක ඒ ප්‍රශ්නය විදේක අධිකාරිය විසින් තීරණය කරනු ලැබිය යුතු අතර ඒ සම්බන්ධයෙන් එහි තීරණය අවසානාත්මක හා තීරණාත්මක වන්නේය.

නියෝගවල 19 වන ඡේදය කියැවෙන ආකාරයට —

"19. මේ නියෝගවල—

"විනාශ වූ දේපළ" යන්නෙන්, 1983 ජූලි මස 24 වන දින හෝ ඉන්පසුව කැරලි කෝලාහල හෝ ජන කැළඹීම් හේතුවෙන් හානියට පත් හෝ විනාශයට පත් යම් නිශ්චල දේපළක් අදහස් වන අතර, විනාශ වූ ව්‍යාපාරයක හෝ කර්මාන්තයක කාර්ය සඳහා ප්‍රයෝජනයට ගන්නා ලද යම් නිශ්චල දේපළක් ද ඊට ඇතුළත් වේ;

"විනාශ වූ ව්‍යාපාර හෝ කර්මාන්ත" යන්නෙන්, 1983 ජූලි මස 24 වන දින හෝ. ඉන් පසුව කැරලි කෝලාහල හෝ ජන කැළඹීම් හේතුවෙන් හානියට පත් හෝ විනාශයට පත් වානිජ හෝ කර්මාන්ත ස්වභාවයේ වූ කවර හෝ ව්‍යාපාරයක් අදහස් වන අතර මේ නියෝගවල විධිවිධාන වලට යටත්ව ඒ ව්‍යාපාරයෙහි හෝ ඒ ව්‍යාපාරය කෙරෙන් ඇති වන සියළු අයිතිවාසිකම්, බලතල, වරප්‍රසාද සහ සම්බන්ධතා ඊට ඇතුළත් වේ.

3. එකී රෙගුලාසිවල 19 ඡේදය යටතේ අර්ථකථනය කොට ඇති ආකාරයට තමා සතු දේපළක්, ව්‍යාපාරයක් හෝ කර්මාන්තයක්, එකී රෙගුලාසිවල 9(1) ඡේදය ප්‍රකාර රජයට පැවරීමට යටත් වෙතැයි යන විශ්වාසයෙන් යුතු ඕනෑම පුද්ගලයකු විසින් එකී රෙගුලාසිවලට අදළ කාරණය සඳහා එම දේපළ, කර්මාන්තය හෝ ව්‍යාපාරය හානියට පත් නොවූ දේපළක් කර්මාන්තයක් හෝ ව්‍යාපාරයක් වශයෙන් ලිඛිතව ප්‍රකාශයට පත් කරන ලෙස විදේක අධිකාරිය වෙත ඉල්ලුම් කරන නියෝජනයක් සලකා බැලීමට එය සූදානමින් සිටින බව විදේක අධිකාරිය විසින් ශ්‍රී ලංකා මහ බැංකුවට දනුම් දී ඇත. එවැනි ඕනෑම නියෝජනයක් වෙළෙඳ බැංකු මගින් එවිය යුතු අතර, එම දේපළ කර්මාන්ත හෝ ව්‍යාපාරයේ පිහිටීම සහ එහි අයිතිය පිළිබඳව විස්තර වාර්තාවක් ද, අවශ්‍ය වුවහොත් අළුත්වැඩියා කිරීම සිදුකිරීමට ඉල්ලුම්කරු සූදානම් බවට ද, අදළ වන්නේ නම් රජයේ ආධාර නොමැතිව තමාගේ ව්‍යාපාර කටයුතු කරගෙන යෑමට හැකි බවට ප්‍රකාශයක්ද කළ යුතුය.

4. වෙළෙඳ බැංකුවක් මගින් එවැනි ඉල්ලීමක් ලත් විට, සිය විමර්ශනයන් හා නිර්දේශයන් සහිත ආවරණ ලිපියක් මගින් වෙළෙඳ බැංකු විසින් එම ඉල්ලීම විදේක අධිකාරිය වෙත යොමු කළ යුතුය. එවැනි යම් නියෝජනයක් අනුග්‍රාහාත්මක අන්දමින් සලකනු ලැබ, අදාළ දේපළ, ව්‍යාපාරය හෝ කර්මාන්තය හානියට පත් නොවූ දේපළක්, ව්‍යාපාරයක් හෝ කර්මාන්තයක් බවට එකී රෙගුලාසිවල 9(2) ප්‍රකාර විදේක අධිකාරිය මගින් ලිඛිත ප්‍රකාශයක් කරන්නේ නම්, බැංකු මගින් සිය නිරීක්ෂණයන්ගේ කොටසක් වශයෙන්, එවැනි අයදුම්කරුවෙකු සමග ගණුදෙනු කිරීමේ දී, 1983 ජූලි 24 වැනි දින හෝ ඊට පසුව දේපළෙහි, ව්‍යාපාරයෙහි හෝ කර්මාන්තයෙහි අයිතියේ හෝ පාලනයේ කිසි වෙනසක් සිදු නොවූ ආකාරයේ පදනමක් මත එම ගණුදෙනු සිදු කරනු ලබන බවට සඳහන් කරන ලෙස බැංකු වෙත මෙයින් යෝජනා කරනු ලැබේ.

5. සාමාන්‍ය බැංකු සේවා පවත්වාගෙන යාමේ අවශ්‍යතාවයත්, එදිනෙද බැංකු කටයුතු වලට බාධා නොවන ලෙසට වගබලා ගැනීමත්, විදේක අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලය අගය කරන බව, මහ බැංකුව වෙත ඒත්තු ගන්වා ඇත. මේ නියෝග වලින් බලපෑමක් ඇති වුව ද, ඉහත සඳහන් කරුණු පෙරදරි කරගෙන, බැරට ඇති මුදල් සඳහා චෙක්පත් මගින් කෙරෙන ගෙවීම් හෝ අයිරා පහසුකම් ද ඇතුළුව වෙළෙඳ බැංකු හා ගණුදෙනු කරුවන් අතර දනට පවත්නා සෑම වැඩ පිළිවෙලක්ම විදේක අධිකාරිය විසින් පිළිගනු ලබනු ඇත.

6. අමුණා ඇති ලියවිල්ලේ අන්තර්ගත කරුණු සියළුම බැංකු වෙත දන්වන ලෙස විදේක අධිකාරියේ සභාපති විසින් මහ බැංකුවෙන් ඉල්ලා ඇත.

වර්ණසේන රාසපුත්‍රම්
අධිපති

චක්‍රලේඛ අංක. 1029

බැංකු කටයුතු දෙපාර්තමේන්තුව,
ශ්‍රී ලංකා මහ බැංකුව,
කොළඹ.

සියළුම වෙළෙඳ බැංකු වෙත,

1983 ඔක්තෝබර් 31

## වෙළෙඳ බැංකු ණය

1983 නොවැම්බර් 1 වැනි දින හෝ ඉන් පසුව පෞද්ගලික අංශයට දී ඇති මුළු අත්තිකාරම් ප්‍රමාණය 1983 ඔක්තෝබර් 31 වැනි දින දක්වා දී ඇති සහ නොපියවා ඇති මුළු අත්තිකාරම් ප්‍රමාණය නොඉක්මවන බවට සහතික වන මෙන් සියළුම වෙළෙඳ බැංකු වෙත මුදල් නීති පනතේ 101 වැනි ඡේදය යටතේ මෙයින් විධානය කරනු ලැබේ.

2. මෙම විධානයේ කාර්යයන් සඳහා—

(අ) ' අත්තිකාරම් ' යනුවෙන් හැඳින්වෙනුයේ පහත දැක්වෙන රූපියල් වත්කම්ය :—

(i) ණය;
(ii) අයිරා;
(iii) මූල්‍යනය කරන ලද ආනයන බිල්පත්; සහ
(iv) මූල්‍යනය කරන ලද මෙරට බිල්පත්;

සහ (ආ) ' පෞද්ගලික අංශය ' යනුවෙන් රජයේ සංස්ථා හා නීතිගත ආයතනද ඇතුළත් වන නමුත් පහත දැක්වෙන ආයතන එයට ඇතුළත් නොවේ;

(i) ලංකා සංවර්ධන මුදල් සංස්ථාව;
(ii) ශ්‍රී ලංකා ජාතික සංවර්ධන බැංකුව;
(iii) ජාතික ඉතිරි කිරීමේ බැංකුව; සහ
(iv) රජයේ උකස් හා ආයෝජන බැංකුව.

3. ණය වෙන්කිරීමේදී පහත සඳහන් අංශ හා කටයුතු ප්‍රමුඛත්වය ලැබිය යුතු ඒවා ලෙස සැළකිය යුතුය.

(i) අපනයන මූල්‍යනය සහ පූර්ව නැව්ගත කිරීම් කටයුතු හෝ ඇසුරුම් ණය;
(ii) මෑතකදී ඇති වූ කලබල හේතු කොටගෙන අලාභහානි සිදුවූ කර්මාන්ත;
(iii) කෘෂිකර්මාන්තය;
(iv) පොහොර, ඛනිජ තෙල්, ඖෂධ වර්ග සහ අත්‍යවශ්‍ය ආහාර වර්ග ආනයනය;
(v) කර්මාන්ත සඳහා අමු ද්‍රව්‍ය;
(vi) රථවාහන හැර අනෙකුත් ප්‍රාග්ධන භාණ්ඩ.

4. ඒක්ෂණ මුදල් වෙළෙඳ පොළෙහි අන්තර් බැංකු ගණුදෙනු වලට මහ බැංකුවේ සීමා බල නොපැවැත්වේ.

ඩබ්. ඒ. ද සිල්වා
ප්‍රධාන ගණකාධිකාරි

වර්ණසේන රාසපුත්‍ර
අධිපති.

**චක්‍රලේඛ අංක. 1033** **1983 නොවැම්බර් 3**

**සියළුම වෙළෙඳ බැංකු වෙත,**

## වෙළෙඳ බැංකු වලට මහ බැංකුවෙන් දෙනු ලබන අත්තිකාරම්

1983 මාර්තු 30 වැනි දින හා අංක 947 සහ සම්බන්ධ අංක බීසී 6 III වෙළුම දරණ මහ බැංකුවේ චක්‍රලේඛය වෙත සියළුම වෙළෙඳ බැංකුවල අවධානය මෙයින් යොමු කෙරේ.

තාවකාලික මුදල් හිඟයන් පිළිබඳව, පැන නැගී ඇති තත්ත්වයට මුහුණ පෑමට හැකිවනු වස් වෙන් කරන ලද මුදල් සීමාවන්ට අතිරික්ත වශයෙන්, ඕනෑම වෙළෙඳ බැංකුවක් විසින් ඉදිරිපත් කරනු ලබන ණය ඉල්ලුම්පත්, මහ බැංකුව විසින් සලකා බැලීමට සූදානම් බවට වෙළෙඳ බැංකුවලට එමගින් දැනුම් දී ඇත. එවැනි ණය පහසුකම් දෙනු ලබන්නේ වසරකට සියයට 20 පොළී අනුපාතිකයකටය.

එවැනි අත්තිකාරම් සඳහා ඇප වශයෙන් වෙළෙඳ බැංකු විසින් ඉදිරිපත් කරන සම පාර්ශ්වික ඇපවල වටිනාකමින් සියයට 50 ක් දක්වා පමණක් සැපයීමට ද බැංකුව තව දුරටත් තීරණය කරන ලදී.

**යූ. ඒ. ද සිල්වා**
**ප්‍රධාන ගණකාධිකාරී.**

**වර්ණසේන රාසපුත්‍ර**
**අධිපති.**

UNIVERSITY OF MORATUWA LIBRARY

**චක්‍රලේඛ අංක. 1042**

**බැංකු කටයුතු දෙපාර්තමේන්තුව,**
**ශ්‍රී ලංකා මහ බැංකුව,**
**කොළඹ 1.**
**1983 නොවැම්බර් 30**

**සියළුම වෙළෙඳ බැංකු වෙත,**

## වෙළෙඳ බැංකු ණය

1983 ඔක්තෝබර් 31 වැනි දින හා අංක 1029 දරණ චක්‍රලේඛය මගින් දැනුම්දෙන ලද මුදල් නීති පනතේ 101 වැනි වගන්තිය යටතේ වූ නියෝගය 1983 දෙසැම්බර් 1 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි අවලංගු කරනු ලැබේ.

2. එසේ වුවද, පහත සඳහන් අංශ හා කාර්යයන් ප්‍රමුඛත්ව පදනමක් යටතේ ණය ලබා දිය යුතු ක්ෂේත්‍රයන් වශයෙන් සැළකිල්ලට ගන්නා ලෙස වෙළෙඳ බැංකුවලින් ඉල්ලා සිටිනු ලැබේ.

(i) අපනයන මූල්‍යයනය හා පූර්ව නැව්ගත කිරීම් කටයුතු හෝ ඇසුරුම් ණය ;
(ii) මෑතදී සිදුවූ කලබල හේතුකොට ගෙන අලාභ හානි සිදුවූ කර්මාන්ත ;
(iii) කෘෂිකර්මාන්තය ;
(iv) පොහොර, ඛනිජ තෙල්, ඖෂධ වර්ග සහ අත්‍යාවශ්‍ය ආහාර වර්ග ;
(v) කර්මාන්ත සඳහා අමු ද්‍රව්‍ය; සහ
(vi) රථවාහන හැර අනෙකුත් ප්‍රාග්ධන භාණ්ඩ.

**යූ. ඒ. ද සිල්වා**
**ප්‍රධාන ගණකාධිකාරී.**

**ඩී. ඇල්. කන්නන්ගර**
**ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය අධිපති**

## ආසියානු නිෂ්කාශන සංගමය මගින් කෙරෙන මෙහෙයවුම් කටයුතු වලට අදල බංගලිදේශ ටාකා, බුරුම ක්‍යාට්, ඉන්දියානු රුපියල, ඉරාන රියාල්, නේපාල රුපියල සහ පකිස්ථානු රුපියල සඳහා මහ බැංකු විනිමය අනුපාතිකයන්

(එක් එක් ව්‍යවහාර මුදල් ඒකක 100 ක් සඳහා රුපියල්)

| දිනය | | චක්‍රලේඛ අංක | බංගලිදේශ ටාකා | | බුරුම ක්‍යාට් | | ඉන්දියානු රුපියල් | | ඉරාන රියාල් | | නේපාල රුපියල් | | පකිස්තානු රුපියල් | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | මිලදී ගැනුම් එතැන් | විකුණුම් එතැන් | මිලදී ගැනුම් එතැන් | විකුණුම් එතැන් | මිලදී ගැනුම් එතැන් | විකුණුම් එතැන් | මිලදී ගැනුම් එතැන් | විකුණුම් එතැන් | මිලදී ගැනුම් එතැන් | විකුණුම් එතැන් | මිලදී ගැනුම් එතැන් | විකුණුම් එතැන් |
| 83·01·03 | .. | 898 | 88·06 | 88·24 | 274·72 | 275·26 | 218·35 | 218·79 | 25·32 | 25·38 | 149·27 | 149·57 | 164·87 | 165·21 |
| 83·01·07 | .. | 901 | 89·40 | 89·58 | 278·91 | 279·47 | 221·69 | 222·13 | 25·71 | 25·77 | 149·50 | 149·80 | 167·39 | 167·73 |
| 83·01·11 | .. | 903 | 88·39 | 88·57 | 278·91 | 279·47 | 218·87 | 219·31 | 25·71 | 25·77 | 149·50 | 149·80 | 167·39 | 167·73 |
| 83·01·17 | .. | 906 | 87·30 | 87·48 | 278·97 | 279·53 | 216·40 | 216·84 | 25·71 | 25·77 | 149·50 | 149·80 | 166·93 | 167·27 |
| 83·01·20 | .. | 911 | 87·30 | 87·48 | 278·97 | 279·53 | 219·06 | 219·50 | 25·71 | 25·77 | 149·50 | 149·80 | 166·93 | 167·27 |
| 83·01·24 | .. | 913 | 87·26 | 87·44 | 275·01 | 275·57 | 215·95 | 216·39 | 25·35 | 25·41 | 149·50 | 149·80 | 164·57 | 164·89 |
| 83·01·25 | .. | 915 | 87·26 | 87·44 | 275·01 | 275·57 | 215·95 | 216·39 | 25·35 | 25·41 | 149·50 | 149·80 | 166·59 | 166·93 |
| 83·01·27 | .. | 918 | 87·26 | 87·44 | 271·67 | 272·21 | 213·33 | 213·75 | 25·04 | 25·10 | 149·50 | 149·80 | 164·58 | 164·90 |
| 83·01·31 | .. | 920 | 87·26 | 87·44 | 271·67 | 272·21 | 215·78 | 216·22 | 25·04 | 25·10 | 149·50 | 149·80 | 164·58 | 164·90 |
| 83·02·01 | .. | 922 | 87·26 | 87·44 | 273·11 | 273·65 | 216·93 | 217·37 | 25·17 | 25·23 | 149·50 | 149·80 | 165·25 | 165·59 |
| 83·02·11 | .. | 926 | 88·72 | 88·90 | 277·68 | 278·24 | 220·57 | 221·01 | 25·59 | 25·65 | 152·01 | 152·31 | 168·03 | 168·37 |
| 83·02·14 | .. | 929 | 90·34 | 90·52 | 282·75 | 283·31 | 224·60 | 225·04 | 26·06 | 26·12 | 154·79 | 155·09 | 171·09 | 171·43 |
| 83·02·15 | .. | 931 | 94·64 | 94·82 | 296·20 | 296·80 | 235·27 | 235·75 | 27·30 | 27·36 | 162·14 | 162·46 | 179·23 | 179·59 |
| 83·02·16 | .. | 933 | 94·71 | 94·89 | 296·20 | 296·80 | 232·59 | 233·05 | 27·30 | 27·36 | 162·26 | 162·58 | 179·11 | 179·47 |
| 83·03·01 | .. | 937 | 93·99 | 94·17 | 296·05 | 296·65 | 231·65 | 232·11 | 27·29 | 27·35 | 161·03 | 161·35 | 179·45 | 179·81 |
| 83·03·16 | .. | 942 | 93·99 | 94·17 | 294·77 | 295·37 | 230·76 | 231·22 | 27·17 | 27·23 | 161·03 | 161·35 | 179·01 | 179·37 |
| 83·04·04 | .. | 948 | 93·99 | 94·17 | 293·82 | 294·40 | 229·84 | 230·30 | 27·08 | 27·14 | 161·03 | 161·35 | 178·51 | 178·87 |
| 83·04·08 | .. | 951 | 93·99 | 94·17 | 293·82 | 294·40 | 232·89 | 233·35 | 27·08 | 27·14 | 161·03 | 161·35 | 178·51 | 178·87 |
| 83·04·12 | .. | 953 | 93·99 | 94·17 | 293·82 | 294·40 | 229·83 | 230·29 | 27·08 | 27·14 | 161·03 | 161·35 | 178·51 | 178·87 |
| 83·04·18 | .. | 955 | 93·99 | 94·17 | 292·25 | 292·83 | 229·62 | 230·08 | 26·94 | 27·00 | 161·03 | 161·35 | 177·69 | 178·05 |
| 83·05·03 | .. | 959 | 93·99 | 94·17 | 293·02 | 293·60 | 230·09 | 230·55 | 27·01 | 27·07 | 161·03 | 161·35 | 178·39 | 178·75 |
| 83·05·16 | .. | 963 | 93·99 | 94·17 | 293·43 | 294·01 | 229·67 | 230·13 | 27·05 | 27·11 | 161·03 | 161·35 | 178·39 | 178·75 |
| 83·06·01 | .. | 967 | 93·99 | 94·17 | 292·86 | 293·44 | 229·68 | 230·14 | 26·99 | 27·05 | 161·03 | 161·35 | 178·39 | 178·75 |
| 83·06·09 | .. | 971 | 93·99 | 94·17 | 289·38 | 289·96 | 231·00 | 231·46 | 26·67 | 26·73 | 161·03 | 161·35 | 176·28 | 176·64 |
| 83·06·16 | .. | 974 | 93·99 | 94·17 | 289·17 | 289·75 | 226·67 | 227·13 | 26·65 | 26·71 | 161·03 | 161·35 | 177·13 | 177·49 |
| 83·06·17 | .. | 976 | 93·99 | 94·17 | 289·17 | 289·75 | 226·67 | 227·13 | 26·65 | 26·71 | 161·03 | 161·35 | 177·10 | 177·46 |
| 83·06·28 | .. | 979 | 93·99 | 94·17 | 289·17 | 289·75 | 226·67 | 227·13 | 26·65 | 26·71 | 161·03 | 161·35 | 175·05 | 175·41 |
| 83·07·01 | .. | 982 | 93·99 | 94·17 | 289·04 | 289·62 | 227·54 | 228·00 | 26·64 | 26·70 | 161·03 | 161·35 | 174·97 | 175·33 |
| 83·07·04 | .. | 984 | 93·99 | 94·17 | 289·04 | 289·62 | 227·54 | 228·00 | 26·64 | 26·70 | 158·65 | 158·97 | 174·97 | 175·33 |
| 83·07·07 | .. | 987 | 98·58 | 98·78 | 303·17 | 303·77 | 238·66 | 239·14 | 27·94 | 28·00 | 166·40 | 166·74 | 183·53 | 183·89 |
| 83·07·18 | .. | 990 | 98·52 | 98·72 | 302·79 | 303·39 | 239·16 | 239·64 | 27·91 | 27·97 | 166·55 | 166·89 | 183·35 | 183·71 |

සම්බන්ධිතයි

## ආසියානු නිෂ්කාශන සංගමය මගින් කෙරෙන මෙහෙයවුම් කටයුතු වලට අදල බංගලිදේශ ටාකා, බුරුම ක්‍යාට්, ඉන්දියානු රුපියල, ඉරාන රියාල්, නේපාල රුපියල සහ පකිස්ථානු රුපියල සඳහා මහ බැංකු විනිමය අනුපාතිකයන්

(එක් එක් ව්‍යවහාර මුදල් ඒකක 100 ක් සඳහා රුපියල්) - සම්බන්ධිතයි.

| දිනය | චක්‍රලේඛ අංක | බංගලිදේශ ටාකා | | බුරුම ක්‍යාට් | | ඉන්දියානු රුපියල් | | ඉරාන රියාල් | | නේපාල රුපියල් | | පකිස්ථානු රුපියල් | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | මිලදී ගැනුම් එතැන් | විකුණුම් එතැන් | මිලදී ගැනුම් එතැන් | විකුණුම් එතැන් | මිලදී ගැනුම් එතැන් | විකුණුම් එතැන් | මිලදී ගැනුම් එතැන් | විකුණුම් එතැන් | මිලදී ගැනුම් එතැන් | විකුණුම් එතැන් | මිලදී ගැනුම් එතැන් | විකුණුම් එතැන් |
| 83·08·04 .. | 993 | 98·68 | 98·88 | 301·82 | 302·42 | 238·65 | 239·13 | 27·82 | 27·88 | 166·73 | 167·07 | 182·32 | 182·68 |
| 83·08·09 .. | 995 | 98·68 | 98·88 | 297·43 | 298·03 | 235·18 | 235·66 | 27·42 | 27·48 | 166·73 | 167·07 | 179·66 | 180·02 |
| 83·08·16 .. | 999 | 98·68 | 98·88 | 296·98 | 297·58 | 235·52 | 236·00 | 27·37 | 27·43 | 166·73 | 167·07 | 179·80 | 180·16 |
| 83·08·26 .. | 1003 | 98·68 | 98·88 | 300·92 | 301·52 | 238·64 | 239·12 | 27·74 | 27·80 | 166·73 | 167·07 | 182·18 | 182·54 |
| 83·09·01 .. | 1006 | 98·68 | 98·88 | 299·80 | 300·40 | 238·09 | 238·57 | 27·63 | 27·69 | 166·73 | 167·07 | 181·37 | 181·73 |
| 83·09·08 .. | 1009 | 98·68 | 98·88 | 299·80 | 300·40 | 238·09 | 238·57 | 27·63 | 27·69 | 163·36 | 163·68 | 181·37 | 181·73 |
| 83·09·16 .. | 1012 | 98·47 | 98·67 | 297·60 | 298·20 | 236·75 | 237·23 | 27·43 | 27·49 | 162·12 | 162·44 | 180·49 | 180·85 |
| 83·10·03 .. | 1015 | 97·41 | 97·61 | 298·64 | 299·24 | 236·65 | 237·13 | 27·53 | 27·59 | 162·26 | 162·58 | 180·46 | 180·82 |
| 83·10·06 .. | 1018 | 97·41 | 97·61 | 298·64 | 299·24 | 233·39 | 233·85 | 27·53 | 27·59 | 162·26 | 162·58 | 180·46 | 180·82 |
| 83·10·11 .. | 1020 | 98·52 | 98·72 | 302·04 | 302·64 | 236·04 | 236·52 | 27·84 | 27·90 | 162·26 | 162·58 | 182·52 | 182·88 |
| 83·10·13 .. | 1023 | 97·30 | 97·50 | 302·04 | 302·64 | 236·04 | 236·52 | 27·84 | 27·90 | 162·26 | 162·58 | 182·52 | 182·88 |
| 83·10·17 .. | 1025 | 97·57 | 97·77 | 302·72 | 303·32 | 236·86 | 237·34 | 27·90 | 27·96 | 162·26 | 162·58 | 181·78 | 182·14 |
| 83·11·01 .. | 1030 | 96·70 | 96·90 | 301·88 | 302·48 | 235·45 | 235·93 | 27·83 | 27·89 | 162·26 | 162·58 | 181·80 | 182·16 |
| 83·11·08 .. | 1034 | 96·70 | 96·90 | 301·88 | 302·48 | 235·45 | 235·93 | 27·83 | 27·89 | 162·26 | 162·58 | 184·10 | 184·46 |
| 83·11·17 .. | 1038 | 97·60 | 97·80 | 302·72 | 303·32 | 236·46 | 236·94 | 27·90 | 27·96 | 163·76 | 164·08 | 184·80 | 185·16 |
| 83·12·01 .. | 1043 | 97·90 | 98·10 | 301·48 | 302·08 | 234·12 | 234·58 | 27·79 | 27·85 | 164·27 | 164·59 | 184·89 | 185·27 |
| 83·12·12 .. | 1046 | 97·90 | 98·10 | 300·74 | 301·34 | 234·73 | 234·19 | 27·72 | 27·78 | 164·27 | 164·59 | 184·06 | 184·42 |
| 83·12·20 .. | 1051 | 99·10 | 99·30 | 302·57 | 303·17 | 235·07 | 235·55 | 27·89 | 27·95 | 163·00 | 163·32 | 183·87 | 184·23 |

| | | මිලදී ගැනුම් | විකුණුම් |
|---|---|---|---|
| බංගලිදේශ ටාකා | | එතැන් මිලදී ගැනුම් සඳහා මසකට ශත 10 බැගින් | එතැන් විකුණුම් සඳහා මසකට අධි මිල ශත 10 බැඟින් |
| බුරුම ක්‍යාට් | | ,, ,, ,, ,, ,, ,, 30 ,, | ,, ,, ,, ,, ,, ,, 30 ,, |
| ඉන්දියානු රුපියල් | 83. 01. 01 සිට 83. 02. 14 | ,, ,, ,, ,, ,, ,, 20 ,, | ,, ,, ,, ,, ,, ,, 20 ,, |
| | 83. 02. 15 සිට 83. 12. 31 | ,, ,, ,, ,, ,, ,, 25 ,, | ,, ,, ,, ,, ,, ,, 25 ,, |
| ඉරාන රියාල් | 83. 01. 01 සිට 83. 02. 28 | ,, ,, ,, ,, ,, ,, 02 ,, | ,, ,, ,, ,, ,, ,, 02 ,, |
| | 83. 03. 01 සිට 83. 12. 31 | ,, ,, ,, ,, ,, ,, 03 ,, | ,, ,, ,, ,, ,, ,, 03 ,, |
| නේපාල රුපියල් | | ,, ,, ,, ,, ,, ,, 15 ,, | ,, ,, ,, ,, ,, ,, 15 ,, |
| පකිස්ථාන් රුපියල් | | ,, ,, ,, ,, ,, ,, 20 ,, | ,, ,, ,, ,, ,, ,, 20 ,, |

## අං සියානු නිෂ්කාශණ සංගමය මගින් කෙරෙන මෙහෙයවුම් කටයුතු සඳහා වෙළෙඳ බැංකු විනිමය අනුපාතිකයන්

(එක් එක් ව්‍යවහාර මුදල් ඒකක සියයක් සඳහා රුපියල්)

| දිනය | | චක්‍රලේඛ අංක | බංගලිදේශ ටාකා | | බුරුම ක්යාට් | | ඉන්දියානු රුපියල් | | ඉරාන රියාල් | | නේපාල රුපියල් | | පකිස්තානු රුපියල් | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | මිලදී ගැනුම් එතැන් | විකුණුම් එතැන් | මිලදී ගැනුම් එතැන් | විකුණුම් එතැන් | මිලදී ගැනුම් එතැන් | විකුණුම් එතැන් | මිලදී ගැනුම් එතැන් | විකුණුම් එතැන් | මිලදී ගැනුම් එතැන් | විකුණුම් එතැන් | මිලදී ගැනුම් එතැන් | විකුණුම් එතැන් |
| 83·01·03 | .. | 899 | 87·96 | 88·34 | 274·42 | 275·56 | 218·15 | 218·99 | 25·30 | 25·40 | 149·12 | 149·72 | 164·67 | 165·41 |
| 83·01·07 | .. | 902 | 89·30 | 89·68 | 278·61 | 279·77 | 221·49 | 222·33 | 25·69 | 25·79 | 149·35 | 149·95 | 167·19 | 167·93 |
| 83·01·11 | .. | 904 | 88·29 | 88·67 | 278·61 | 279·77 | 217·67 | 219·51 | 25·69 | 25·79 | 149·35 | 149·95 | 167·19 | 167·93 |
| 83·01·17 | .. | 907 | 87·20 | 87·58 | 278·67 | 279·83 | 216·20 | 217·04 | 25·69 | 25·79 | 149·35 | 149·95 | 166·73 | 167·47 |
| 83·01·20 | .. | 912 | 87·20 | 87·58 | 278·67 | 279·83 | 218·86 | 219·70 | 25·69 | 25·79 | 149·35 | 149·95 | 166·73 | 167·47 |
| 83·01·24 | .. | 914 | 87·16 | 87·54 | 274·71 | 275·87 | 215·75 | 216·59 | 25·33 | 25·43 | 149·35 | 149·95 | 164·37 | 165·09 |
| 83·01·25 | .. | 916 | 87·16 | 87·54 | 274·71 | 275·87 | 215·75 | 216·59 | 25·33 | 25·43 | 149·35 | 149·95 | 166·39 | 167·13 |
| 83·01·27 | .. | 919 | 87·16 | 87·54 | 271·37 | 272·51 | 213·13 | 213·95 | 25·02 | 25·12 | 149·35 | 149·95 | 164·38 | 165·10 |
| 83·01·31 | .. | 921 | 87·16 | 87·54 | 271·37 | 272·51 | 215·58 | 216·42 | 25·02 | 25·12 | 149·35 | 149·95 | 164·38 | 165·10 |
| 83·02·01 | .. | 923 | 87·16 | 87·54 | 272·81 | 273·95 | 216·73 | 217·57 | 25·05 | 25·25 | 149·35 | 149·95 | 165·05 | 165·79 |
| 83·02·11 | .. | 927 | 88·62 | 89·00 | 277·38 | 278·54 | 220·37 | 221·21 | 25·57 | 25·67 | 151·86 | 152·46 | 167·83 | 168·57 |
| 83·02·14 | .. | 930 | 90·24 | 90·62 | 282·45 | 283·61 | 224·40 | 225·24 | 26·04 | 26·14 | 154·64 | 155·24 | 170·89 | 171·63 |
| 83·02·15 | .. | 932 | 94·54 | 94·92 | 295·90 | 297·10 | 235·02 | 236·00 | 27·28 | 27·38 | 161·99 | 162·61 | 179·03 | 179·79 |
| 83·02·16 | .. | 934 | 94·61 | 94·99 | 295·90 | 297·10 | 232·34 | 233·30 | 27·28 | 27·38 | 162·11 | 162·73 | 178·91 | 179·67 |
| 83·03·01 | .. | 938 | 93·89 | 94·27 | 295·75 | 296·95 | 231·40 | 232·36 | 27·26 | 27·38 | 160·88 | 161·50 | 179·25 | 180·01 |
| 83·03·16 | .. | 943 | 93·89 | 94·27 | 294·47 | 295·67 | 230·51 | 231·47 | 27·14 | 27·26 | 160·88 | 161·50 | 178·81 | 179·57 |
| 83·04·04 | .. | 949 | 93·89 | 94·27 | 293·52 | 294·70 | 229·59 | 230·55 | 27·05 | 27·17 | 160·88 | 161·50 | 178·31 | 179·07 |
| 83·04·08 | .. | 952 | 93·89 | 94·27 | 293·52 | 294·70 | 232·64 | 233·60 | 27·05 | 27·17 | 160·88 | 161·50 | 178·31 | 179·07 |
| 83·04·12 | .. | 954 | 93·89 | 94·27 | 293·52 | 294·70 | 229·58 | 230·54 | 27·05 | 27·17 | 160·88 | 161·50 | 178·31 | 179·07 |
| 83·04·18 | .. | 956 | 93·89 | 94·27 | 291·95 | 293·13 | 229·37 | 230·33 | 26·91 | 27·03 | 160·88 | 161·50 | 177·49 | 178·25 |
| 83·05·03 | .. | 960 | 93·89 | 94·27 | 292·72 | 293·90 | 229·84 | 230·80 | 26·98 | 27·10 | 160·88 | 161·50 | 178·19 | 178·95 |
| 83·05·16 | .. | 964 | 93·89 | 94·27 | 293·13 | 294·31 | 229·42 | 230·38 | 26·02 | 27·14 | 160·88 | 161·50 | 178·19 | 178·95 |
| 83·06·01 | .. | 968 | 93·89 | 94·27 | 292·56 | 293·74 | 229·43 | 230·39 | 26·96 | 27·08 | 160·88 | 161·50 | 178·19 | 178·95 |
| 83·06·09 | .. | 972 | 93·89 | 94·27 | 289·08 | 290·26 | 230·75 | 231·71 | 26·64 | 26·76 | 160·88 | 161·50 | 176·08 | 176·84 |
| 83·06·16 | .. | 975 | 93·89 | 94·27 | 288·87 | 290·05 | 226·42 | 227·38 | 26·62 | 26·74 | 160·88 | 161·50 | 176·93 | 177·69 |

සම්බන්ධිතයි.

## ආසියානු නිෂ්කාශණ සංගමය මගින් කෙරෙන මෙහෙයවුම් කටයුතු සඳහා වෙළෙඳ බැංකු විනිමය අනුපාතිකයන්

(එක් එක් ව්‍යවහාර මුදල් ඒකක සියයක් සඳහා රුපියල්)—සම්බන්ධිතයි.

| දිනය | චක්‍රලේඛ අංක | බංගලිදේශ ටාකා | | බුරුම ක්‍යාට | | ඉන්දියානු රුපියල් | | ඉරාන රියාල් | | නේපාල රුපියල් | | පකිස්තානු රුපියල් | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | මිලදී ගැනුම් එතැන් | විකුනුම් එතැන් | මිලදී ගැනුම් එතැන් | විකුණුම් එතැන් | මිලදී ගැනුම් එතැන් | විකුණුම් එතැන් | මිලදී ගැනුම් එතැන් | විකුණුම් එතැන් | මිලදී ගැනුම් එතැන් | විකුණුම් එතැන් | මිලදී ගැනුම් එතැන් | විකුණුම් එතැන් |
| 83.06.17 | 977 | 93.89 | 94.27 | 288.87 | 290.05 | 226.42 | 227.38 | 26.62 | 26.74 | 160.88 | 161.50 | 176.90 | 177.66 |
| 83.06.28 | 980 | 93.89 | 94.27 | 288.87 | 290.05 | 226.42 | 227.38 | 26.62 | 26.74 | 160.88 | 161.50 | 174.85 | 175.61 |
| 83.07.01 | 983 | 93.89 | 94.27 | 288.74 | 289.92 | 227.29 | 228.25 | 26.61 | 26.73 | 160.88 | 161.50 | 174.77 | 175.53 |
| 83.07.04 | 985 | 93.89 | 94.27 | 288.74 | 289.92 | 227.29 | 228.25 | 26.61 | 26.73 | 158.50 | 159.12 | 174.77 | 175.53 |
| 83.07.17 | 988 | 98.48 | 98.82 | 302.87 | 304.07 | 238.41 | 239.39 | 27.91 | 28.03 | 166.25 | 166.89 | 183.33 | 184.09 |
| 83.07.18 | 991 | 98.42 | 98.82 | 302.49 | 303.69 | 238.91 | 239.89 | 27.88 | 28.00 | 166.40 | 167.04 | 183.15 | 183.91 |
| 83.08.04 | 994 | 98.58 | 98.98 | 301.52 | 302.72 | 238.40 | 239.38 | 27.79 | 27.91 | 166.58 | 167.22 | 182.12 | 182.88 |
| 83.08.09 | 996 | 98.58 | 98.98 | 297.13 | 298.33 | 234.93 | 235.91 | 27.39 | 27.51 | 166.58 | 167.22 | 179.46 | 180.22 |
| 83.08.16 | 1000 | 98.58 | 98.98 | 296.68 | 297.88 | 235.27 | 236.25 | 27.34 | 27.46 | 166.58 | 167.22 | 179.60 | 180.36 |
| 83.08.26 | 1004 | 98.58 | 98.98 | 300.62 | 301.82 | 238.39 | 239.37 | 27.71 | 27.83 | 166.58 | 167.22 | 181.98 | 182.74 |
| 83.09.01 | 1007 | 98.58 | 98.98 | 299.50 | 300.70 | 237.84 | 238.82 | 27.60 | 27.72 | 166.58 | 167.22 | 181.17 | 181.93 |
| 83.09.08 | 1010 | 98.58 | 98.98 | 299.50 | 300.70 | 237.84 | 238.82 | 27.60 | 27.72 | 163.21 | 163.83 | 181.17 | 181.93 |
| 83.09.16 | 1013 | 98.37 | 98.77 | 297.30 | 298.50 | 236.50 | 237.48 | 27.40 | 27.52 | 161.97 | 162.59 | 180.29 | 181.05 |
| 83.10.03 | 1016 | 97.31 | 97.71 | 298.34 | 299.54 | 236.40 | 237.38 | 27.50 | 27.62 | 162.11 | 162.73 | 180.26 | 181.02 |
| 83.10.06 | 1019 | 97.31 | 97.71 | 298.34 | 299.54 | 233.14 | 234.10 | 27.50 | 27.62 | 162.11 | 162.73 | 180.26 | 181.02 |
| 83.10.11 | 1021 | 98.42 | 98.82 | 301.74 | 302.94 | 235.79 | 236.77 | 27.81 | 27.93 | 162.11 | 162.73 | 182.32 | 183.08 |
| 83.10.13 | 1024 | 97.20 | 97.60 | 301.74 | 302.94 | 235.79 | 236.77 | 27.81 | 27.93 | 162.11 | 162.73 | 182.32 | 183.08 |
| 83.10.17 | 1026 | 97.47 | 97.87 | 302.42 | 303.62 | 236.61 | 237.59 | 27.87 | 27.99 | 162.11 | 162.73 | 181.58 | 182.34 |
| 83.11.01 | 1031 | 96.60 | 97.00 | 301.58 | 302.78 | 235.20 | 236.18 | 27.80 | 27.92 | 162.11 | 162.73 | 181.60 | 182.36 |
| 83.11.08 | 1035 | 96.60 | 97.00 | 301.58 | 302.78 | 235.20 | 236.18 | 27.80 | 27.92 | 162.11 | 162.73 | 183.90 | 184.66 |
| 83.11.17 | 1039 | 97.50 | 97.90 | 302.42 | 303.62 | 236.21 | 237.19 | 27.87 | 27.99 | 163.61 | 164.23 | 184.60 | 185.36 |
| 83.12.01 | 1044 | 97.80 | 98.20 | 301.18 | 302.38 | 233.87 | 234.83 | 27.76 | 27.88 | 164.12 | 164.74 | 184.69 | 185.47 |
| 83.12.12 | 1047 | 97.80 | 98.20 | 300.44 | 301.64 | 233.48 | 234.44 | 27.69 | 27.81 | 164.12 | 164.74 | 183.86 | 184.62 |
| 83.12.20 | 1052 | 99.00 | 99.40 | 302.27 | 303.47 | 234.82 | 235.80 | 27.86 | 27.98 | 162.85 | 163.47 | 183.67 | 184.43 |

UNIVERSITY OF MORATUWA × SRI LANKA × LIBRARY

## වෙළෙඳ බැංකුවලින් විදේශීය ව්‍යවහාර මුදල් නෝට්ටු මිල දී ගැනීම සඳහා මහ බැංකුවේ විනිමය අනුපාතිකයන්

| දිනය | වකුලේඛ අංකය | ඕස්ට්‍රේලියානු ඩොලර් (ඩොලර් 1) | ඔස්ට්‍රියානු ශිලි. (ශිලි. 10) | බහරේන් ඩිනාර් (ඩිනාර් 1) | බෙල්ජියානු ෆ්‍රෑන්ක් (ෆ්‍රෑ. 100) | කැනේඩියානු ඩොලර් (ඩොලර් 1) | ඩෙනිෂ් ක්‍රෝනර් (ක්‍රෝ. 10) | ඩොයිෂ් මාර්ක් (බටහිර ජර්මනිය) (ඩො. මා. 10) | ප්‍රංශ ෆ්‍රෑන්ක් (ෆ්‍රෑ. 10) | ෆින්නිෂ් මාර්ක්කා (මාර්ක්කා 10) | හොංකොං ඩොලර් (ඩොලර් 10) | ඉතාලි ලීරා (ලීරා 1000) | ජපන් යෙන් (යෙන් 1000) | කුවේට් ඩිනාර් (ඩිනාර් 1) | මලයානු රින්ගිට් (රින්ගිට් 10) | නෙදර්ලන්ත ගිල්ඩර් (ගිල්. 10) | නෝර්වීජියානු ක්‍රෝනර් (ක්‍රෝ. 10) | ඕමාන් රියාල් (රි. 1) | කටාර් රියාල් (රි. 10) | සවුදි අරාබියානු රියාල් (රි. 10) | සිංගප්පූරු ඩොලර් (ඩො. 10) | ස්වීඩන් ක්‍රෝනර් (ක්‍රෝ. 10) | ස්විස් ෆ්‍රෑන්ක් (ෆ්‍රෑන්ක් 10) | එ. අරාබි රාජ්‍ය ඩර්හෑම් (ඩර්හෑම් 10) | එ. රා. පවුම් (පවුම් 1) | අමෙ. එ. ජ. ඩොලර් (ඩොලර් 1) |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 83·01·05 | 900 | 20·10 | 12·30 | 54·50 | 44·25 | 16·70 | 24·65 | 87·05 | 30·70 | | 31·60 | 15·10 | 89·40 | 70·85 | 89·45 | 78·70 | 29·30 | 58·15 | 55·25 | 59·70 | 98·10 | 28·25 | 103·65 | 55·90 | 33·45 | 20·50 |
| 83·01·12 | 905 | 20·30 | 12·55 | 54·50 | 44·70 | 16·75 | 24·90 | 87·95 | 31·05 | 38·40 | 31·55 | 15·25 | 90·20 | 70·90 | 90·30 | 79·65 | 29·45 | 58·15 | 55·25 | 59·70 | 99·25 | 28·40 | 106·65 | 55·90 | 32·40 | 20·50 |
| 83·01·19 | 910 | 20·30 | 12·40 | 54·50 | 44·10 | 16·75 | 24·55 | 86·65 | 30·55 | 38·00 | 31·50 | 15·10 | 88·90 | 70·90 | 90·25 | 78·60 | 29·30 | 58·15 | 55·25 | 59·70 | 99·15 | 28·15 | 105·60 | 55·90 | 32·55 | 20·50 |
| 83·01·26 | 917 | 20·00 | 11·85 | 54·60 | 42·85 | 16·70 | 23·75 | 83·50 | 29·50 | 37·15 | 31·05 | 14·55 | 85·45 | 71·05 | 89·90 | 76·25 | 28·70 | 58·30 | 55·35 | 59·85 | 98·80 | 27·50 | 101·60 | 56·05 | 31·35 | 20·55 |
| 83·02·02 | 924 | 19·85 | 11·90 | 54·45 | 42·25 | 16·60 | 23·55 | 82·70 | 29·20 | 36·90 | 31·05 | 14·40 | 85·00 | 70·85 | 89·80 | 75·35 | 28·50 | 58·15 | 55·20 | 59·65 | 98·50 | 27·25 | 101·10 | 55·90 | 31·20 | 20·50 |
| 83·02·09 | 925 | 20·15 | 12·00 | 55·25 | 43·50 | 17·00 | 24·25 | 85·20 | 30·00 | 37·80 | 31·45 | 14·80 | 87·50 | 71·20 | 90·90 | 77·20 | 29·20 | 59·00 | 56·00 | 60·55 | 99·55 | 27·95 | 103·10 | 56·70 | 31·85 | 20·50 |
| 83·02·14 | 928 | 21·45 | 13·05 | 58·70 | 46·65 | 18·05 | 26·00 | 91·95 | 32·40 | 40·45 | 33·50 | 15·95 | 94·35 | 75·60 | 97·65 | 83·20 | 31·30 | 62·65 | 59·50 | 64·30 | 107·05 | 29·90 | 110·00 | 60·25 | 34·20 | 22·10 |
| 83·02·23 | 935 | 21·30 | 13·05 | 58·40 | 46·70 | 17·95 | 25·95 | 92·00 | 32·45 | 40·40 | 33·35 | 15·95 | 94·65 | 75·25 | 97·20 | 83·20 | 31·15 | 62·35 | 59·20 | 64·00 | 106·60 | 29·85 | 110·50 | 59·95 | 33·65 | 22·00 |
| 83·03·02 | 939 | 20·95 | 12·85 | 58·55 | 45·85 | 17·95 | 25·40 | 90·40 | 31·85 | 39·85 | 33·35 | 15·65 | 92·35 | 75·40 | 96·65 | 81·70 | 30·75 | 62·50 | 59·35 | 64·15 | 105·85 | 29·45 | 106·70 | 60·05 | 33·30 | 22·05 |
| 83·03·09 | 940 | 18·90 | 13·15 | 58·55 | 46·85 | 18·05 | 25·60 | 92·35 | 32·25 | 40·15 | 33·30 | 15·65 | 93·45 | 75·40 | 96·60 | 83·45 | 30·90 | 62·50 | 59·35 | 64·15 | 105·90 | 29·70 | 107·75 | 60·05 | 33·35 | 22·05 |
| 83·03·16 | 941 | 19·25 | 13·15 | 58·45 | 48·35 | 18·00 | 25·75 | 92·80 | 32·60 | 40·15 | 33·25 | 15·60 | 93·15 | 75·30 | +10·55 | 83·70 | 30·85 | 62·40 | 59·25 | 64·05 | 106·00 | 29·70 | 107·30 | 60·00 | 33·45 | 22·00 |
| 83·03·22 | 944 | 19·15 | 13·10 | 58·55 | 46·85 | 18·00 | 25·70 | 92·05 | 30·65 | 39·80 | 33·00 | 15·35 | 91·80 | 75·40 | 96·10 | 82·95 | 30·90 | 62·50 | 59·35 | 64·15 | 105·55 | 29·70 | 106·65 | 60·05 | 32·65 | 22·05 |
| 83·03·30 | 946 | 19·10 | 12·85 | 58·50 | 45·80 | 17·90 | 25·55 | 90·85 | 30·30 | 39·45 | 32·75 | 15·25 | 92·25 | 75·40 | 95·65 | 80·80 | 30·55 | 62·45 | 59·30 | 64·10 | 105·20 | 29·25 | 106·00 | 60·05 | 32·15 | 22·05 |
| 83·04·06 | 950 | 19·10 | 12·85 | 58·45 | 45·95 | 17·80 | 25·65 | 91·20 | 30·40 | 39·50 | 32·80 | 15·30 | 92·25 | 75·30 | 95·90 | 81·00 | 30·70 | 62·40 | 59·25 | 64·05 | 105·30 | 29·45 | 106·55 | 60·00 | 32·30 | 22·00 |
| 83·04·20 | 957 | 19·10 | 12·75 | 58·55 | 44·90 | 17·80 | 25·25 | 89·50 | 29·85 | 39·70 | 32·00 | 15·05 | 92·45 | 75·60 | 95·40 | 79·45 | 30·80 | 62·40 | 59·25 | 63·80 | 104·60 | 29·35 | 106·90 | 59·95 | 34·55 | 22·00 |
| 83·04·28 | 958 | 19·15 | 12·75 | 58·45 | 45·20 | 17·95 | 25·30 | 90·10 | 30·05 | 39·80 | 32·05 | 15·15 | 93·10 | 75·65 | 95·50 | 80·00 | 31·00 | 62·40 | 59·25 | 63·85 | 104·85 | 29·45 | 107·40 | 59·95 | 34·55 | 22·00 |
| 83·05·04 | 961 | 19·15 | 12·70 | 58·50 | 44·95 | 17·95 | 25·20 | 89·55 | 29·85 | 39·70 | 31·65 | 15·05 | 92·70 | 75·60 | 95·35 | 79·75 | 31·05 | 62·45 | 59·30 | 63·90 | 104·90 | 29·45 | 106·55 | 60·00 | 34·75 | 22·05 |
| 83·05·11 | 962 | 19·20 | 12·85 | 58·45 | 45·35 | 17·95 | 25·40 | 90·65 | 30·05 | 39·95 | 31·95 | 15·20 | 95·00 | 75·80 | 96·05 | 80·55 | 31·20 | 62·40 | 59·25 | 63·85 | 105·65 | 29·50 | 108·20 | 59·95 | 34·40 | 22·00 |
| 83·05·18 | 965 | 19·50 | 12·70 | 58·50 | 44·80 | 17·90 | 25·10 | 89·55 | 29·70 | 39·70 | 31·65 | 15·00 | 94·60 | 75·80 | 95·85 | 79·65 | 30·95 | 62·45 | 59·30 | 63·90 | 105·45 | 29·40 | 107·95 | 60·00 | 34·35 | 22·05 |
| 83·05·31 | 966 | 19·50 | 12·50 | 58·65 | 44·10 | 17·95 | 24·60 | 88·05 | 29·35 | 39·50 | 30·95 | 14·85 | 92·95 | 75·70 | 96·00 | 78·35 | 30·95 | 62·55 | 59·40 | 64·05 | 105·50 | 29·40 | 106·35 | 60·15 | 35·50 | 22·10 |
| 83·06·08 | 970 | 19·45 | 12·25 | 58·75 | 43·30 | 17·90 | 24·15 | 86·45 | 28·75 | 39·15 | 29·75 | 14·55 | 92·25 | 75·70 | 95·45 | 77·05 | 30·65 | 62·70 | 59·55 | 64·15 | 104·70 | 29·05 | 104·55 | 60·30 | 34·90 | 22·15 |
| 83·06·16 | 973 | 19·35 | 12·20 | 58·75 | 43·20 | 17·90 | 24·20 | 86·35 | 28·65 | 38·95 | 30·00 | 14·55 | 91·15 | 75·60 | 94·95 | 77·10 | 30·40 | 62·70 | 59·55 | 64·15 | 104·05 | 28·85 | 103·70 | 60·30 | 33·80 | 22·15 |
| 83·06·22 | 978 | 19·40 | 12·30 | 58·70 | 43·60 | 17·95 | 24·30 | 87·15 | 28·90 | 39·20 | 31·45 | 14·65 | 92·65 | 75·60 | 95·20 | 77·85 | 30·25 | 62·00 | 58·90 | 64·15 | 104·35 | 28·90 | 105·15 | 60·25 | 33·95 | 22·10 |
| 83·06·29 | 981 | 19·35 | 12·40 | 58·65 | 43·50 | 17·95 | 24·15 | 86·95 | 28·95 | 39·10 | 30·70 | 14·65 | 92·25 | 75·65 | 94·85 | 77·60 | 30·25 | 61·95 | 58·80 | 64·05 | 103·95 | 28·95 | 105·00 | 60·20 | 33·75 | 22·10 |

සම්බන්ධිතයි

## වෙළෙඳ බැංකුවලින් විදේශීය ව්‍යවහාර මුදල් නෝට්ටු මිල දී ගැනීම සඳහා මහ බැංකුවේ විනිමය අනුපාතිකයන්

සම්බන්ධිතයි.

| දිනය | චක්‍රලේඛ අංකය | ඔස්ට්‍රේලියානු ඩොලර් (ඩොලර් 1) | ඔස්ට්‍රියානු ෂිලිං (ෂිලිං 10) | බහරේන් ඩිනාර් (ඩිනාර් 1) | බෙල්ජියානු ෆ්‍රෑන්ක් (ෆ්‍රෑ. 100) | කැනේඩියානු ඩොලර් (ඩොලර් 1) | ඩෙනිෂ් ක්‍රෝනර් (ක්‍රෝ. 10) | ඩොයිෂ් මාර්ක් (බටහිර ජර්මනිය) (ඩො. මා. 10) | ප්‍රංශ ෆ්‍රෑන්ක් (ප්‍ර. ෆ්‍රෑ. 10) | ෆිනිෂ් මාර්ක්කා (මාර්ක්කා 10) | හොංකොං ඩොලර් (ඩොලර් 10) | ඉතාලි ලීරා (ලීරා 1000) | ජපන් යෙන් (යෙන් 1000) | කුවේට් ඩිනාර් (ඩිනාර් 1) | මලයානු රින්ගිට් (රින්ගිට් 10) | නෙදර්ලන්ත ගිල්ඩර් (ගිල්. 10) | නෝර්වේජියානු ක්‍රෝනර් (ක්‍රෝ. 10) | ඕමාන් රියාල් (රි. 1) | කටාර් රියාල් (රි. 10) | සවුදි අරාබියානු රියාල් (රි. 10) | සිංගප්පූර් ඩොලර් (ඩො. 10) | ස්වීඩන් ක්‍රෝනර් (ක්‍රෝ. 10) | ස්විස් ෆ්‍රෑන්ක් (ෆ්‍රෑ. 10) | එක්සත් අරාබි රාජ්‍ය ඩිර්හැම් (ඩිර්හැම් 10) | එ. රා. පවුම (පවුම 1) | ඇමෙ. එ. ජ. ඩොලර් (ඩොලර් 1) |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 83·07·05 | 986 | 20·30 | 13·00 | 61·60 | 45·45 | 18·85 | 25·30 | 91·00 | 30·30 | 40·90 | 32·75 | 15·35 | 96·60 | 79·15 | 99·80 | 81·20 | 31·75 | 65·10 | 61·80 | 67·30 | 109·30 | 30·35 | 109·90 | 63·25 | 35·50 | 23·20 |
| 83·07·14 | 989 | 20·20 | 12·75 | 61·60 | 44·80 | 18·85 | 25·00 | 89·70 | 29·85 | 40·70 | 32·45 | 15·15 | 96·50 | 79·30 | 99·65 | 80·20 | 31·70 | 65·10 | * — | 67·35 | *10·90 | 30·20 | *10·95 | 63·25 | 35·55 | 23·20 |
| 83·07·20 | 992 | 20·25 | 12·70 | 61·60 | 44·70 | 18·85 | 24·90 | 89·50 | 29·75 | 40·65 | 32·25 | 15·10 | 96·50 | 79·25 | 99·55 | 80·05 | 31·60 | 65·05 | — | 67·30 | 10·90 | 30·15 | 10·90 | 63·20 | 35·35 | 23·20 |
| 83·08·10 | 997 | 20·35 | 12·25 | 61·70 | 43·05 | 18·80 | 24·00 | 86·50 | 28·75 | 39·75 | 31·25 | 14·55 | 95·25 | 79·40 | 98·75 | 77·40 | 30·95 | 65·20 | — | 67·05 | 10·80 | 29·50 | 10·70 | 63·35 | 34·75 | 23·25 |
| 83·08·17 | 1001 | 20·40 | 12·20 | 61·80 | 43·25 | 18·85 | 24·00 | 86·65 | 28·80 | 39·90 | 31·20 | 14·60 | 94·90 | 79·50 | 98·60 | 77·40 | 31·20 | 65·25 | — | 67·10 | 10·85 | 29·50 | 10·80 | 63·40 | 34·85 | 23·30 |
| 83·08·25 | 1002 | 20·60 | 12·60 | 61·80 | 43·95 | 18·90 | 24·50 | 88·25 | 29·30 | 40·25 | 31·30 | 14·75 | 95·75 | 79·85 | 99·60 | 78·90 | 31·45 | 65·30 | — | 66·95 | 10·95 | 29·85 | 10·85 | 63·45 | 35·45 | 23·30 |
| 83·08·31 | 1005 | 20·55 | 12·50 | 62·00 | 43·40 | 18·95 | 24·20 | 87·25 | 28·95 | 39·95 | 31·20 | 14·60 | 95·00 | 80·15 | 99·30 | 78·00 | 31·25 | 65·50 | — | 67·15 | 10·90 | 29·60 | 10·70 | 63·65 | 35·10 | 23·35 |
| 83·09·07 | 1008 | 20·45 | 12·40 | 62·00 | 43·30 | 19·00 | 24·20 | 87·15 | 28·90 | 39·90 | 30·55 | 14·60 | 95·00 | 80·05 | 99·30 | 77·90 | 31·30 | 65·50 | — | 67·15 | 10·90 | 29·55 | 10·70 | 63·65 | 35·05 | 23·35 |
| 83·09·14 | 1011 | 20·75 | 12·55 | 63·80 | 43·65 | 19·00 | 24·45 | 87·85 | 29·15 | 40·25 | 30·20 | 14·70 | 96·15 | 80·40 | 99·80 | 78·50 | 31·55 | 65·60 | — | 67·30 | 10·95 | 29·75 | 10·75 | 63·75 | 35·10 | 23·40 |
| 83·09·23 | 1014 | 21·15 | 12·60 | 64·50 | 43·90 | 19·20 | 24·70 | 88·70 | 29·35 | 40·30 | 29·00 | 14·75 | 97·55 | 81·25 | + 10·05 | 79·30 | 31·90 | 66·35 | — | 68·00 | 11·05 | 30·05 | 10·95 | 64·45 | 35·55 | 23·65 |
| 83·10·05 | 1017 | 21·30 | 12·80 | 62·75 | 44·35 | 19·20 | 24·90 | 90·05 | 29·60 | 40·55 | 27·25 | 14·85 | 100·90 | 81·45 | + 10·05 | 80·55 | 32·20 | 66·30 | — | 68·00 | 11·05 | 30·25 | 11·15 | 64·40 | 34·95 | 23·65 |
| 83·10·12 | 1022 | 21·65 | 13·00 | 62·70 | 44·70 | 19·15 | 25·20 | 91·25 | 29·75 | 40·80 | 28·45 | 15·00 | 101·45 | 81·40 | + 10·05 | 81·25 | 32·40 | 66·25 | — | 67·95 | 11·05 | 30·45 | 11·20 | 64·35 | 35·90 | 23·65 |
| 83·10·19 | 1027 | 21·70 | 12·90 | 62·75 | 44·95 | 19·20 | 25·30 | 91·50 | 29·90 | 40·70 | 30·05 | 15·05 | 101·85 | 81·65 | + 10·05 | 81·60 | 32·45 | 66·30 | — | 67·95 | 11·05 | 30·45 | 11·25 | 64·40 | 35·55 | 23·65 |
| 83·10·26 | 1028 | 21·75 | 12·90 | 62·80 | 44·60 | 19·20 | 25·10 | 91·00 | 29·75 | 40·60 | 30·35 | 14·95 | 101·80 | 81·75 | + 10·05 | 80·95 | 32·25 | 66·35 | — | 68·00 | 11·05 | 30·40 | 11·20 | 64·45 | 35·50 | 23·65 |
| 83·11·02 | 1032 | 21·70 | 12·85 | 63·05 | 44·20 | 19·25 | 24·90 | 89·90 | 29·55 | 40·60 | 30·45 | 14·80 | 101·25 | 82·05 | + 10·10 | 80·25 | 32·15 | 66·60 | — | 68·25 | 11·10 | 30·30 | 11·05 | 64·70 | 35·50 | 23·75 |
| 83·11·09 | 1036 | 21·65 | 12·60 | 63·05 | 43·65 | 19·25 | 24·65 | 88·75 | 29·25 | 40·15 | 30·45 | 14·60 | 100·50 | 81·45 | +10·10 | 79·25 | 31·90 | 66·65 | — | 68·30 | 11·10 | 30·15 | 10·90 | 64·75 | 35·30 | 23·75 |
| 83·11·16 | 1037 | 21·90 | 12·65 | 63·20 | 43·75 | 19·25 | 24·75 | 88·90 | 29·25 | 40·40 | 30·50 | 14·60 | 101·45 | 81·60 | + 10·15 | 79·45 | 32·05 | 66·80 | — | 68·45 | 11·15 | 30·20 | 11·00 | 64·85 | 35·35 | 23·80 |
| 83·11·23 | 1040 | 22·00 | 12·55 | 64·95 | 43·00 | 19·30 | 24·50 | 88·65 | 29·10 | 40·05 | 30·60 | 14·60 | 101·70 | 81·90 | +10·20 | 79·10 | 31·85 | 67·00 | — | 68·70 | 11·20 | 30·05 | 10·95 | 65·05 | 35·15 | 23·95 |
| 83·11·30 | 1041 | 21·80 | 12·55 | 63·55 | 43·35 | 19·25 | 24·35 | 88·10 | 28·95 | 40·10 | 30·65 | 14·55 | 101·95 | 81·95 | + 10·20 | 78·65 | 31·75 | 67·15 | — | 68·85 | 11·20 | 29·95 | 10·95 | 65·25 | 34·90 | 23·95 |
| 83·12·07 | 1045 | 21·75 | 12·40 | 63·65 | 43·20 | 19·25 | 24·30 | 87·60 | 28·80 | 39·95 | 30·70 | 14·45 | 102·40 | 82·05 | + 10·25 | 78·25 | 31·75 | 67·30 | — | 68·95 | 11·25 | 29·90 | 10·95 | 65·35 | 34·75 | 24·05 |
| 83·12·14 | 1048 | 21·65 | 12·40 | 63·90 | 43·05 | 19·30 | 24·05 | 87·35 | 28·70 | 39·90 | 30·80 | 14·45 | 102·00 | 82·25 | + 10·30 | 77·90 | 31·00 | 67·55 | — | 69·20 | 11·30 | 29·80 | 10·85 | 65·60 | 34·40 | 24·10 |
| 83·12·21 | 1053 | 21·30 | 12·40 | 64·25 | 43·00 | 19·40 | 24·15 | 87·55 | 28·70 | 39·90 | 31·00 | 14·45 | 102·85 | 82·60 | + 10·35 | 78·00 | 31·05 | 67·90 | — | 69·55 | 11·35 | 29·90 | 10·95 | 65·95 | 34·40 | 24·25 |

\+ ව්‍යවහාර මුදල් ඒකකයකට අනුපාතිකයන්

* 1983·07·14 දින සිට මහ බැංකුව මෙම ව්‍යවහාර මුදල් සම්බන්ධව මිල ගණන් දැන්වීම අත්හිටවන ලදී.